සැ. යු. - 2020.05.29 වැනි දින පළ වූ අංක 2178 දරන ගැසට් පත්‍රයේ I : II (අ) I : III, II කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,179 - 2020 ජුනි මස 04 වැනි බ්‍රහස්පතින්දා - 2020.06.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 620 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 622 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 628 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2020 ජුනි මස 26 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 ජුනි මස 12 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# බඩු බාහිරාදිය විකිණීම්

## මාලිගාකන්ද මහෙස්ත්‍රාත් අධිකරණය

### අධිකරණයට ඉදිරිපත් කරන ලද නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මාලිගාකන්ද මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදළ රාජසන්තක කරන ලද සහ මෙතෙක් හිමිකම් නොපාන ලද මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති නඩු භාණ්ඩ 2020.06.28 ඉරිදා දින පෙ. ව. 10.00ට මාලිගාකන්ද මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත උපලේඛනයේ සඳහන් කිසියම් භාණ්ඩයක් පිළිබඳව හිමිකම් පාන්නකු වේනම් වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ලිඛිතව ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ එදින පෙ. ව. 9.30 සිට 10.00 දක්වා කාලය තුළ දී පරීක්ෂා කර බැලිය හැකි ය.

04. අධිකරණය විසින් නියම කරන ලද අවම ලන්සුව නොපිළිගන්නා අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය මෙම අධිකරණය සතු ය.

05. වෙන්දේසියේ දී මිළ දී ගන්නා සියලුම භාණ්ඩ සඳහා එම අවස්ථාවේ දී ම මුදලින් ගෙවීම කළ යුතු අතර, චෙක්පත් මුදල් ඇණවුම් ආදිය කිසිසේත් භාරගනු නොලැබේ.

06. වෙන්දේසියෙන් මිළ දී ගනු ලබන භාණ්ඩ එම අවස්ථාවේදී ම අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

07. වෙන්දේසියේ දී භාණ්ඩ මිළ දී ගන්නන් විසින් තමන්ගේ අනන්‍යතාවය ජාතික හැඳුනුම්පත හෝ ඒ හා සමාන පිළිගතහැකි ලියවිල්ලකින් තහවුරු කිරීම අනිවාර්ය වේ.

මහෙස්ත්‍රාත්,<br>
මහෙස්ත්‍රාත් අධිකරණය,<br>
මාලිගාකන්ද, කොළඹ 10.

2020 මැයි මස 27 වැනි දින,<br>
මාලිගාකන්ද මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### උපලේඛනය

| අනු. අංකය | නඩු අංකය | | භාණ්ඩ විස්තරය |
|---|---|---|---|
| 1. | 722/02 | | පාපැදි 01යි |
| 2. | 93250/08 | | වාහන සිග්නල් ලයිට් කප් 04 |
| 3. | 9/C | | වාහන ලයිට් 02යි |
| 4. | 9901/C | | වාහන ලයිට් 01යි |
| 5. | 78692/08 | | වයර් රෝලක් |
| 6. | 9554/C | | අත් ඔරලෝසු 01යි |
| 7. | 8445/13 | | තරාදි 01යි |
| 8. | 1576/15 | | Orange වර්ගයේ ට්‍රිප් ස්විච් අඩංගු ගෝනි 01යි |
| 9. | 81147/12 | | ස්ටූල් 01යි |
| 10. | 81201/08 | | මොනිටර් 01යි |
| 11. | 80146/සී | | ජැක් (වාහන) අඩංගු පාර්සලය |
| 12. | 4780/සී | | ෆෑන් එකක බඳ කොටස |
| 13. | 7262/සී | | Moniter 01යි |
| 14. | 5455/සී | | තණකොළ කපන මැෂින් 01යි |
| 15. | 214/98 | | බාල්දි එකයි |
| 16. | 3638/03 | | ප්‍රින්ටර් එකයි |
| 17. | 215/03 | | ත්‍රීවීල් වයිෆර් මෝටර් 01යි |
| 18. | 47/03 | | කාර් ලයිට්02, වයිපර් අමතර කොටස් |
| 19. | 35371/වර්ෂ රහිත | | ඉලෙක්ට්‍රොනික් තරාදි 01යි |
| 20. | 877/20 | | විදුලි ස්ත්‍රික්ක 03යි |
| 21. | 33500/20 | | විදුලි ස්ත්‍රික්ක 03යි |
| 22. | 3043/20 | | විදුලි ස්ත්‍රික්ක 03යි |
| 23. | 894/20 | | විදුලි ස්ත්‍රික්ක 03යි |
| 24. | 31576/20 | | විදුලි ස්ත්‍රික්ක 04යි |
| 25. | 31591/19 | | විදුලි ස්ත්‍රික්ක 02යි |
| 26. | 31585/19 | | විදුලි ස්ත්‍රික්ක 02යි |
| 27. | 2309/20 | | විදුලි ස්ත්‍රික්ක 02යි |
| 28. | 879/20 | | විදුලි ස්ත්‍රික්ක 01යි |
| 29. | 6209/20 | | විදුලි ස්ත්‍රික්ක 01යි |
| 30. | 34100/19 | | විදුලි ස්ත්‍රික්ක 01යි |
| 31. | 38312/19 | | විදුලි ස්ත්‍රික්ක 01යි |
| 32. | 34100/19 | | විදුලි ස්ත්‍රික්ක 01යි |
| 33. | 3032/20 | | විදුලි ස්ත්‍රික්ක 01යි |
| 34. | 36459/20 | | විදුලි ස්ත්‍රික්ක 01යි |
| 35. | 3077/20 | | හොට් ප්ලේට් 01යි |
| 36. | 36790/20 | | රොටි මේකර් 01යි |
| 37. | 1679/20 | | විදුලි කේතල් 01යි |
| 38. | 4064/20 | | රයිස් කුකර් 01යි |
| 39. | 31587/19 | | ග්‍රයින්ඩර් 02යි |
| 40. | 3071/20 | | සබ් ස්පීකර් 01යි |
| 41. | 32304/19 | | රවුල කපන මැෂින් 01යි |
| 42. | 39147/19 | | වීඩියෝ ප්ලේයර් 01යි |
| 43. | 36470/19 | | HD BOX විදුලි උපාංග 02යි |
| 44. | 6240/20 | | ටෝස්ටර් 01යි |
| 45. | 888/20 | (i) | ටෝස්ටර් 01යි |
| | | (ii) | මේස ලාම්පු 01යි |
| | | (iii) | බ්ලෙන්ඩර් 01යි |
| 46. | 894/20 | (i) | පාද සම්භාහන මැෂින් 05යි |
| | | (ii) | ස්ටීම් බියුටි මැෂින් 01යි |
| | | (iii) | කොණ්ඩය කපන මැෂින් 02යි |
| | | (iv) | කොණ්ඩය සකසන මැෂින් 03යි |
| 47. | 28313/19 | | ඇන්ටනා 01යි |
| 48. | 3037/20 | | එලාම් ඔරලෝසු 01යි |
| 49. | 31575/19 | | මේස ලාම්පු 02යි |
| 50. | 878/20 | | මේස ලාම්පු 02යි |
| 51. | 2101/20 | | මේස ලාම්පු 01යි |
| 52. | 31583/19 | | මේස ලාම්පු 02යි |
| 53. | 870/20 | | විදුලි පන්දම් 01යි |
| 54. | 2105/20 | | විදුලි පන්දම් 01යි |
| 55. | 33196/20 | | විදුලි පන්දම් 01යි |
| 56. | 1850/20 | | විදුලි පන්දම් 01යි |
| 57. | 2087/20 | | රේඩියෝ 02යි |
| 58. | 30331/19 | | රේඩියෝ යන්ත්‍ර 04යි |
| 59. | 31579/19 | | රේඩියෝ යන්ත්‍ර 02යි |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 60. | 2087/20 | රේඩියෝ යන්ත්‍ර 03යි |
| 61. | 36463/19 | සීලර් 02යි |
| 62. | 30604/19 | වයර් කෝඩ් 02යි |
| 63. | 36464/19 | මල්ටි ප්ලග් 01යි |
| 64. | 33194/19 | හොම් චාර්ජර් 01යි |
| 65. | 33494/19 | බවුත් 10යි |
| 66. | 31592/19 | බවුත් 06යි |
| 67. | 36454/19 | කොණ්ඩා සැකසුම් උපකරණ 01යි |
| 68. | 3048/20 | රැවුල කපන මැෂින් 01යි |
| 69. | 36453/19 | සාරි 01යි |
| 70. | 34104/19 | සාරි 01යි |
| 71. | 3320/20 | සාරි 01යි |
| 72. | 38514/20 | සාරි 01යි |
| 73. | 882/20 | සාරි 01යි |
| 74. | 39146/19 | සාරි 01යි |
| 75. | 2083/20 | සරම් 01යි |
| 76. | 6210/20 | සරම් 01යි |
| 77. | 38515/19 | ටී ෂර්ට් 01යි |
| 78. | 39148/19 | ෂර්ට් 02යි |
| 79. | 872/19 | ෂර්ට් 06යි |
| 80. | 38527/19 | ෂර්ට් 01යි |
| 81. | 4031/20 | පිරිමි යට බැනියම් 11යි |
| 82. | 403/20 | කාන්තා ගවුම් 01යි |
| 83. | 887/20 | පාසල් බෑග් 01යි |
| 84. | 2078/20 | පාසල් බෑග් 01යි |
| 85. | 31586/19 | පර්ස් 01යි |
| 86. | 2197/20 | ක්‍රීඩා උපකරණ 01යි |
| 87. | 2058/20 | පෝන් කවර 01යි |
| 88. | 3047/20 | පෝන් කවර 01යි |
| 89. | 2143/20 | පෝන් කවර 01යි |
| 90. | 198/20 | කාන්තා අත් ඔරලෝසු 01යි |
| 91. | 33490/19 | ඔරලෝසු 01යි |
| 92. | 4051/20 | ගලි කවර 01යි |
| 93. | 2097/20 | එයාර් පම්ප් 01යි |
| 94. | 32314/19 | බෝල් වැල් 01යි |
| 95. | 33488/19 | බෝල් වැල් 01යි |
| 96. | 38588/19 | බෝල් වැල් 01යි |
| 97. | 4016/20 | එල්බෝ කෑලි 03යි |
| 98. | 6227/20 | පැඩ් ලොක් 01යි |
| 99. | 34398/19 | ජල කරාම 01යි |
| 100. | 38310/19 | ගෑස් සිලින්ඩර් 02යි |
| 101. | 19838/16 | ග්‍රිල් කටු තොගය |
| 102. | 25900/15 | ත්‍රීරෝද රථ අමතර රෝදය |
| 103. | 21011/16 | ත්‍රී රෝද රථ අමතර රෝදය |
| 104. | 22425/15 | පිත්තල සරනේරු ජනෙල් ලොක් සොයිබර් |
| 105. | 41479/18 | වාහන පැති කණ්ණාඩි වීදුරු 03යි |
| 106. | 723/19 | වාහන පැති කණ්ණාඩි 01යි |
| 107. | 5403/16 | වාහන අමතර කොටස් |
| 108. | AR 59/20 | ගැල්වනයිස් බට 14යි |
| 109. | 11465/10 | ජංගම දුරකථන 01යි |
| 110. | 36661/14 | ජංගම දුරකථන 01යි |
| 111. | 37463/14 | ජංගම දුරකථන 01යි |
| 112. | 36730/19 | ජංගම දුරකථන 02යි |
| 113. | 24482/14 | ජංගම දුරකථන 01යි |
| 114. | 23999/16 | ජංගම දුරකථන 01යි |
| 115. | 19391/14 | ජංගම දුරකථන 02යි |
| 116. | 12111/16 | ජංගම දුරකථන 01යි |
| 117. | 14795/13 | ජංගම දුරකථන 01යි |
| 118. | 5104/2 | (i) ජංගම දුරකතන 03යි |
| | | (ii) බැටරි 02යි |
| | | (iii) හැන්ඩ් ෆ්‍රී 02යි |
| 119. | 31148/19 | ජංගම දුරකතන බැටරි 01යි |
| 120. | 33304/19 | (i) ජංගම දුරකථන 01යි |
| | | (ii) හැන්ඩ් ෆ්‍රී 01යි |
| 121. | 51703/11 | ජංගම දුරකථන 01යි |
| 122. | 28859/10 | ජංගම දුරකථන 01යි |
| 123. | 4019/20 | ජංගම දුරකථන 02යි |
| 124. | 26557/19 | තරාදි 01යි |
| 125. | 22366/14 | ප්ලාස්ටික් වතුර බෝතල් 06යි |
| 126. | නඩු අංක රහිත | විවිධ ප්‍රමාණවල කාපට් 09 |
| 127. | නඩු අංක රහිත | ප්ලාස්ටික් බඳුන් 07යි |
| 128. | නඩු අංක රහිත | ටෙන්ට් රෙදි 01යි |
| 129. | නඩු අංක රහිත | බැට් 01යි |
| 130. | නඩු අංක රහිත | වීදුරු තොගය |
| 131. | නඩු අංක රහිත | වාහන ලයිට් තොගය |
| 132. | නඩු අංක රහිත | බෆල් 02යි |
| 133. | නඩු අංක රහිත | අඟල් 1/2 වතුර මෝටර් 01යි |
| 134. | නඩු අංක රහිත | මහන මැෂින් 03යි |
| 135. | නඩු අංක රහිත | 134 A වර්ගයේ ගෑස් සිලින්ඩර් 01යි |
| 136. | නඩු අංක රහිත | පුතීල 06යි |
| 137. | නඩු අංක රහිත | හෙල්මට් 04යි |
| 138. | නඩු අංක රහිත | කුඩා කැමරා 01යි |
| 139. | නඩු අංක රහිත | වාහන බැටරි 01යි |
| 140. | නඩු අංක රහිත | ත්‍රීවිල් ටයර් 01යි |
| 141. | නඩු අංක රහිත | යකඩ තරාදි 01යි |
| 142. | නඩු අංක රහිත | වාහන ජැක් 01යි |
| 143. | නඩු අංක රහිත | රින්ච් 01යි |
| 144. | නඩු අංක රහිත | තණකොළ කපන මැෂින් 01යි |
| 145. | නඩු අංක රහිත | පලංචි ලොක් තොගය |
| 146. | නඩු අංක රහිත | විදුලි පංකා 01යි |
| 147. | නඩු අංක රහිත | ඇඹරුම් යන්ත්‍ර 01යි |
| 148. | නඩු අංක රහිත | විදුලි පංකා 01යි |
| 149. | නඩු අංක රහිත | සිවිලිං පංකා 03යි |
| 150. | නඩු අංක රහිත | මොනිටර් 02යි |
| 151. | නඩු අංක රහිත | කී බෝඩ් 03යි, මවුස් 02යි |
| 152. | නඩු අංක රහිත | වාහන ජැක් 03යි |
| 153. | නඩු අංක රහිත | වාහන රෝද ඇණ ආවරණ 08යි |
| 154. | නඩු අංක රහිත | අලවංගු 03යි |
| 155. | නඩු අංක රහිත | ගැල්වනයිස් බට 04යි |
| 156. | නඩු අංක රහිත | වාහන පැති කණ්නාඩි තොගය |
| 157. | නඩු අංක රහිත | රූපවාහිනී යන්ත්‍ර 01යි |
| 158. | නඩු අංක රහිත | රූපවාහිනී යන්ත්‍ර 01යි |
| 159. | | විවිධ නඩු අංක යටතේ එකතු වූ හිස් බෝතල් තොගය |
| 160. | | විවිධ නඩු අංක යටතේ එකතු වූ හිස් බූලි තොගය |
| 161. | | විවිධ නඩු අංක යටතේ එකතු වූ වයර් කැබලි තොගය |

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

මගේ අංකය : ARA/ADM/ADMIN/6/7/5.

**ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

රා තැබෑරුම් රේන්ද විකිණීම - 2020/2021 වර්ෂය

**2020 ජූලි සිට 2021 ජූනි දක්වා**

2020 ජූලි මස 01 දින සිට 2021 ජූනි මස 30 දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු 20 වන දින අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළවී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයකටම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් මුදල් තැන්පත් කළ බවට ලබා ගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල පරිමාණයෙන් යටත් පිරිසයින් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතුය.

3. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙලවරෙහි අංක............. රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය යනුවෙන් පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2020.06.23 වන දින පෙ.ව. 10.30 ට පෙර ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් එම වේලාවට පෙර ආරච්චිකට්ටුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

4. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම සඳහා 1982.08.20 වැනි දින පළවී ඇති අංක 207 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතුය.

5. 2020.06.23 වැනි දින පෙ.ව. 10.30 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

6. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර ආරච්චිකට්ටුව ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිය.

ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
ආරච්චිකට්ටුව.

2020 අප්‍රේල් මස 11 වැනි දින.

*උපලේඛනය*

| *කොට්ඨාසය* | *ග්‍රාමය* | *තැබෑරම් අංකය* | *ටෙන්ඩර් භාර ගන්නා අවසන් දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් කළ යුතු මුදල රු.* |
|---|---|---|---|---|
| ආරච්චිකට්ටුව | කරුකුපනේ | 10 | 2020.06.23 පෙ.ව. 10.30 | 1,000 |
| ආරච්චිකට්ටුව | ආරච්චිකට්ටුව | 11 | 2020.06.23 පෙ.ව. 10.30 | 1,000 |
| ආරච්චිකට්ටුව | බත්තුළුඔය | 12 | 2020.06.23 පෙ.ව. 10.30 | 1,000 |

06-33

**2020-2021 වර්ෂය සඳහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා රේන්ද විකිණීම**

2020 ජූලි මස 01 වැනි දින සිට 2021 ජුනි මස 30 දින දක්වා

2020 ජූලි මස 01 දින සිට 2021 ජුනි මස 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982.08.20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ප්‍රසම්පාදන භාරගනු ලැබේ.

02. සෑම ප්‍රසම්පාදන පත්‍රයකම කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍රය පිරවිය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ප්‍රසම්පාදන තැන්පත් මුදලින්, තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසෙන් 15% ක වටිනාකමින් යුත් වත්කම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.

03. විධිමත් ලෙස සකස් කරනු ලැබූ සෑම ප්‍රසම්පාදනයක් ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි වම් කෙළවරේ අංක ............ දරන ........................ රා තැබෑරුම සඳහා ප්‍රසම්පාදන පත්‍රය යනුවෙන් උප ලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ නම හා අංකය සඳහන් කොට 2020.06.22 වැනි දින ප. ව. 01.00 ට පෙර කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එම වේලාවට පෙර කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන පෙට්ටියේ බහාලිය යුතු ය.

04. ප්‍රසම්පාදන ඉදිරිපත් කිරීම 1982.08.20 දින පළ වී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට ඇතුළත් විය යුතු ය.

05. 2020.06.22 වැනි දින ප. ව. 01.00 ට ප්‍රසම්පාදනපත්‍ර භාරගැනීම අවසන් කළ වහාම ප්‍රසම්පාදනපත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ දී සියලු ප්‍රසම්පාදනකරුවන් කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

06. ඉදිරිපත් කරන ලද ටෙන්ඩර්පත් අතුරින් තෝරා ගනු ලබන සාර්ථකම ගැනුම්කරු විසින් මාස 02කට වැඩි තැන්පතු මුදල සහ එක් මසක බලපත්‍ර ගාස්තුව එදිනම ගෙවිය යුතුය.

07. උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් අතුරින් එකක් හෝ කිහිපයක් 2020.06.22 වැනි දින විකිණීමට නොහැකි වුවහොත් නැවත විකිණීම සඳහා 2020 ජුනි මස 29 වැනි දින ප. ව. 01.00 දක්වා ප්‍රසම්පාදනපත් භාර ගන්නා අතර, ප්‍රසම්පාදන පත් භාර ගැනීම අවසන් කළ වහාම ප්‍රසම්පාදන පත්‍ර විවෘත කරනු ලැබේ. මේ සඳහා ද ඉහතින් සඳහන් සියලු කොන්දේසි අදාළ වන බව ද සැලකිය යුතු ය.

08. මහජනතාවගේ හා ශිෂ්‍යයන්ගේ යහපත උදෙසා දැනට පවත්වන ස්ථානයෙන් වෙනත් ස්ථානයකට මාරු කළ හැකිය.

09. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

පොන්නම්පලම් ධනේෂ්වරන්,
ප්‍රාදේශීය ලේකම්,
කුච්චවේලි.

2020 මැයි මස 22 වැනි දින,
කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| *අනු. අංකය* | *කොට්ඨාසය* | *ප්‍රාදේශීය පළාත* | *විවෘත කරන වේලාව* | *වසන වේලාව* | *ආපසු ගෙවනු ලබන ප්‍රසම්පාදන තැන්පතු මුදල රු.* | *ආපසු නොගෙවනු ලබන ප්‍රසම්පාදන තැන්පතු මුදල රු.* |
|---|---|---|---|---|---|---|
| 03. | කුච්චවේලි | නිලාවේලි අංක 04 | පෙ. ව. 11.00<br>ප. ව. 5.00 | ප. ව. 2.00<br>ප. ව. 8.00 | 3,000 | 1,000 |

06-37

## හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

2020/2021 වර්ෂය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම

2020 ජූලි මස 01 වැනි දින සිට 2021 ජූනි මස 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා පහත දක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක් ම ඕනෑ ම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයෙන් දක්වා ඇති ටෙන්ඩර් මුදල් තැන්පත් කළ බවට ලබා ගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මුදලෙන් යටත් පිරිසෙයින් 15% වටිනාකමට ලබාගත් වත්කම් සහතිකයක් ද ඊට ඇමිණිය යුතුය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක් ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙලවරෙහි අංක .................................. දරන ......................... රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය යනුවෙන් පහත සඳහන් උපලේඛනයේ පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කර 2020.06.22 වැනි දින පෙ.ව. 10.30 ට පෙර හලාවත ප්‍රාදේශීය ලේකම් වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් එම වේලාවට පෙර හලාවත ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

04. 2020 වර්ෂය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළ වී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ දක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතුය.

05. 2020.06.22 වැනි දින පෙ.ව. 10.30 ට ටෙන්ඩර්පත්‍ර භාරගැනීම අවසන් කළ වහා ම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට හලාවත ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ පෙනී සිටිය හැකිය.

06. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිය. (දුරකථන අංක : 032-2223205/032-2222138).

බී. ඩබ්. එම්. එම්. එස්. බණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
හලාවත.

2020 මැයි මස 22 වැනි දින,
ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය,
හලාවත.

උපලේඛනය

| *කොට්ඨාසය* | *ග්‍රාමය* | *ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශත* |
|---|---|---|---|
| හලාවත පළාත් ආණ්ඩු සභාවට අයත් අංක 02 දරන කොට්ඨාසය | ඉච්චම්පිටිය | 2020.06.22 පෙ.ව. 10.30 | 2,000.00 |
| හලාවත පළාත් ආණ්ඩු සභාවට අයත් අංක 03 දරන කොට්ඨාසය | කොට්ඨාසය තුළ වෙනත් සුදුසු ස්ථානයක් සොයා ගත යුතුය. | - එම - | 1,000.00 |
| උතුරු පිටිගල් කෝරළේ | ඔළිඳළුව | - එම - | 250.00 |

06-08

**පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

රා තැබෑරුම් රේන්ද විකිණීම 2020/2021 වර්ෂය

**2020 ජූලි මස 01 සිට 2021 ජුනි මස 30 දක්වා**

2020 ජූලි මස 01 සිට 2021 ජුනි මස 30 දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982.08.20 වැනි දින අංක 207 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි සහ සෑම සුරාබදු බලපත්‍රයකටම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි අතර, එය නියමිත ආකෘති පත්‍රයෙන් සකස් විය යුතු ය. එසේ ම පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.

3. විධිමත් ලෙස සැලසුම් කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරේ "අංක ....................................... දරන .......................................... රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2020.06.18 දින පෙ.ව. 10.30 ට පෙර පුත්තලම ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එම වේලාවට පෙර පුත්තලම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතු ය.

4. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළ වී ඇති අංක 207 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතුය.

5. 2020.06.18 වන දින පෙ.ව 10.30ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

6. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිය.

එච්. එම්. සංජීවනී හේරත්,
ප්‍රාදේශීය ලේකම්,
පුත්තලම.

2020 මැයි මස 26 වැනි දින.
ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය,
පුත්තලම.

**උපලේඛනය**

| *අනුක්‍රමික අංකය* | *කොට්ඨාසය* | *ග්‍රාමය* | *තැබෑරුම විවෘත කරන වේලාව* | *තැබෑරුම වසන වේලාව* | *ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල* |
|---|---|---|---|---|---|---|
| 01 | පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | සේනකුඩිරිප්පුව | පෙ. ව 11.00<br>ප. ව. 5.00 | ප. ව. 2.00<br>ප. ව. 8.00 | 2020.06.18<br>පෙ. ව. 10.30 | රු. 1000/- |

06-28

**මඩකලපුව දිස්ත්‍රික්කය - ඒරාවූර් පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

රා තැබෑරුම් රේන්ද විකිණීම

**2020 ජූලි මස සිට 2021 ජුනි මස දක්වා - ආරුමුගත්තාන් කුඩියිරුප්පු රා තැබෑරුම් රේන්ද විකිණීම**

අංක 207 දරන 1982.08.20 දින ප්‍රකාශ කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පළ කරන ලද 1982 වර්ෂයේ රා තැබෑරුම් රේන්ද විකිණීමේ විධිවිධානයේ මඩකලපුව දිස්ත්‍රික්කයේ ඒරාවූර් පත්තුව, වෙංකලඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ආරුමුගත්තාන් කුඩියිරුප්පු රා තැබෑරුම් සඳහා 2020 ජූලි මස 01 වැනි දින සිට 2021 ජුනි මස 30 වැනි දින දක්වා රා විකිණීමේ පෞද්ගලික අයිතියට ටෙන්ඩර් ඉල්ලුම්පත් පහත සඳහන් දින හා වේලාව දක්වා ඒරාවූර් පත්තුව, වෙංකලඩි ප්‍රාදේශීය ලේකම් විසින් එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී භාර ගනු ලැබේ. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේ ටෙන්ඩර්කරුවන් ඒරාවූර් පත්තුව, වෙංකලඩි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණිය යුතු ය.

01. ටෙන්ඩර් ඉල්ලුම්පත්‍රය වෙනුවෙන් රු. 1,500 ක මුදලක් ඒරාවූර් පත්තුව, වෙංකලඩි ප්‍රාදේශීය ලේකම් නමින් එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ගෙවා ලබා ගන්නා ලද රිසිට්පත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඉල්ලුම්පත ලබා ගත හැකි ය. ටෙන්ඩර්පත් සමග රිසිට්පත අමුණා තිබිය යුතු ය. ටෙන්ඩර්පත් නිකුත් කරනු ලබන්නේ 2020.06.04 දින සිට 2020.06.18 දින ප. ව. 3.00 දක්වා වේ.

02. ඒ ඒ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන වටිනාකම් සහතික ටෙන්ඩර්කරුවන් බදු පත්‍රයේ සඳහන් කරනු ලබන මුදලින් 15% කට නොඅඩු නොවිය යුතු ය. මෙම වටිනාකම් සහතිකය ටෙන්ඩර් සමග ඇමිණිය යුතු ය.

03. ටෙන්ඩර්පත් වැරදි ලෙස පුරවා තිබේ නම් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් නොකර ටෙන්ඩර්පත්‍ර සඳහා ගෙවන ලද මුදල නැවත ලබා ගැනීමට අවශ්‍ය නම් ඔබගේ ඉල්ලීම ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කරන ලද දින සිට සති දෙක ඇතුළත ඔබ විසින් ලබාගත් ටෙන්ඩර්පත සම්පූර්ණ නොකර මුදල් ගෙවූ රිසිට්පත් සමග නැවත ඉදිරිපත් කරන්නේනම් එම ඉල්ලීම සලකා බලනු ලැබේ.

05. දැනට තිබෙන තැබෑරුම් ඉඩම් ඉදිරි කාලවලටත් තිබේදැයි සහතික නැත.

06. ලියාපදිංචි කරන ලද පොල් සහ තල් සංගම් මෙම රේන්ද විකිණීමේ දී සහභාගි වන්නේ නම් සංගම පිහිටා තිබෙන ප්‍රදේශයට රා තැබෑරුමට පමණක් ඉල්ලුම්පත් ඉදිරිපත් කළ හැකි ය. ඒ සමග සංගමය දැනට ක්‍රියාත්මක වන බවටත් සංගමය විසින් රා තැබෑරුම් බදු ගෙන පවත්වා ගෙන යාමට හැකියාව තිබීම සම්බන්ධව මඩකලපුව දිස්ත්‍රික් සමුපකාර සහකාර කොමසාරිස් විසින් සහතික කරන ලද ලිපිය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ. (මුදල් අමාත්‍යාංශයේ අංක 01/2012 දරන හා 2012.01.05 වැනි දිනැති චක්‍රලේඛයට අනුව).

07. අනිකුත් තොරතුරු ඒරාවූර් පත්තුව, වෙංකලඩි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකි ය.

එන්. විල්වරත්නම්,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
ඒරාවූර් පත්තුව,
වෙංකලඩි.

2020 මැයි මස 21 වැනි දින.

**රා තැබෑරුම පිහිටුවිය යුතු ස්ථානය**

| *තැබෑරුම් පිහිටුවිය යුතු ස්ථානය* | *තැබෑරුමේ අංකය* | *ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය හා වේලාව* | |
|---|---|---|---|
| | | *දිනය* | *වේලාව* |
| ආරුමුගත්තාන් කුඩියිරුප්පු | **TT No. 1** | 2020.06.19 | පෙ. ව. 10.00 |

***සටහන* .-** 1. ටෙන්ඩර් කමිටුව 2020.06.19 වැනි දින පෙ. ව. 10.00 ට රැස්වේ.
2. විකුණුම් දිනයේ සුදුසු බදුකරු තෝරා නොගත්තොත් නැවත විකිණීම් 2020.06.25 වැනි දින පෙ. ව. 10.00 ට පැවැත්වේ.

06-10

## රේන්ද විකිණීම

### මඩකලපුව දිස්ත්‍රික්කයේ මණ්මුනයි දකුණ එරුවිල් පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය එරුවිල් සහ මාංකාඩු රා තැබෑරුම් රේන්ද විකිණීම - 2020 ජූලි සිට 2021 ජූනි

අංක 207 දරන 1982.08.20 වැනි දින ප්‍රකාශ කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද 1982 වර්ෂයේ රා තැබෑරුම් රේන්ද විකිණීමේ විධිවිධාන අනුව මඩකලපුව දිස්ත්‍රික්කයේ මණ්මුනයි දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය එරුවිල් සහ මාංකාඩු රා තැබෑරුම් සඳහා 2020 ජූලි මස 01 වැනි දින සිට 2021 ජූනි මස 30 වැනි දින දක්වා රා විකිණීමේ පෞද්ගලික අයිතියට ටෙන්ඩර් ඉල්ලුම්පත් පහත සඳහන් දින හා වේලාව දක්වා මණ්මුනයි දකුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී බාර ගනු ලැබේ. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේ ටෙන්ඩර්කරුවන් මණ්මුනයි දකුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවත්වන ටෙන්ඩර් මණ්ඩල රැස්වීම සඳහා පැමිණ සිටිය යුතුය.

01. ටෙන්ඩර් ඉල්ලුම්පත්‍රය වෙනුවෙන් රුපියල් එක්දහස් පන්සීයක (රු. 1,500) මුදලක් මණ්මුනයි දකුණ ප්‍රාදේශීය ලේකම් නමින් ගෙවා ලබා ගන්නා ලද රිසිට්පත ඉදිරිපත් කිරීමෙන් ඉල්ලුම්පත ලබා ගත හැකි ය. ටෙන්ඩර්පත සමග රිසිට්පත අමුණා තිබිය යුතු ය. ටෙන්ඩර්පත් නිකුත් කරනු ලබන්නේ 2020.06.01 වැනි දින සිට 2020.06.22 වැනි දින ප. ව. 3.00 දක්වා වේ.

02. ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන වටිනාකම් සහතික ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරනු ලබන මුදලින් 15% ට අඩු නොවිය යුතු ය. මෙම වටිනාකම් සහතිකය ටෙන්ඩර්පත්‍ර සමග ඇමිණිය යුතු ය.

03. ටෙන්ඩර්පත් වැරදි ලෙස පුරවා තිබේ නම් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර්පත් ඉදිරිපත් නොකරන ටෙන්ඩර්පත් සඳහා ගෙවන ලද මුදල නැවත ලබා ගැනීමට අවශ්‍ය නම් ඔබගේ ඉල්ලීම ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ දින සිට සති දෙකක් තුළ ඔබ ලබාගත් ටෙන්ඩර්පත සම්පූර්ණ නොකර මුදල් ගෙවූ රිසිට්පත සමග නැවත ඉදිරිපත් කරන්නේනම් එම ඉල්ලීම සලකා බලනු ලැබේ.

05. තැබෑරුම දැනට පවත්වන ස්ථානයේ ඉදිරි කාලයේත් අඛණ්ඩව තිබේදැයි සහතික නොමැත.

06. ලියාපදිංචි කළ පොල් හා තල් සමුපකාර සමිති මෙම රේන්ද විකිණීමේ දී සහභාගිවන්නේ නම් සමිතිය පිහිටුවා ඇති ප්‍රදේශයට අයත් රා තැබෑරුම සඳහා පමණක් ඉල්ලුම්පත ඉදිරිපත් කළ හැකි අතර දැනට සමිතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳව ද හා රා තැබෑරුම බදු ගෙන පවත්වා ගෙන යාමට ඇති හැකියාව පිළිබඳව ද මඩකලපුව දිස්ත්‍රික් සහකාර සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් සහතික කරන ලද ලිපිය ඉදිරිපත් කිරීමෙන් පසුව ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ. (මුදල් අමාත්‍යාංශයේ අංක 01/2012 හා 2012.01.05 දින දරන චක්‍රලේඛය අනුව තිබිය යුතුය.)

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මණ්මුනයි දකුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිය.

සිවප්‍රියා විල්වරද්නම්,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මණ්මුනයි දකුණ එරුවිල් පත්තු.

2019 මැයි මස 04 වැනි දින.

**රා තැබෑරුම් පිහිටුවිය යුතු ස්ථානය**

| *තැබෑරුම් පිහිටුවිය යුතු ස්ථානය* | *තැබෑරුම් පිහිටුවිය යුතු ස්ථාන* | *තැබෑරුම් අංකය* | *ටෙන්ඩර් ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය* | *වේලාව* |
|---|---|---|---|---|
| මාංකාඩු ගම | මාංකඩු | TT No. - 4 | 2020.06.23 | පෙ. ව. 11.30 |
| එරුවිල් ගම | එරුවිල් | TT No. - 6 | 2020.06.23 | පෙ. ව. 11.30 |

***සටහන*** .- 1. ටෙන්ඩර් මණ්ඩල 2020.06.23 වැනි දින පෙරවරු 11.30 ට රැස්වේ.

2. විකුණුම් දින සුදුසු බදුකරු තෝරා නොගතහොත් නැවත විකිණීම 2020.06.30 වැනි දින පෙරවරු 11.30ට පැවැත්වේ.

06-102

# රජයේ නොවන දැන්වීම්

## ඇටර්නි බලය අවලංගු කිරීම

ඉතාලිය, බොලෝන්යා, ටෙරස්, පයටියටි, සනෝ, කාසල් 40024, නො. 18, මොටියොලි, නො. වියා 9 හි පදිංචි (ඉතාලියානු ගුවන් ගමන් බලපත්‍ර අංක වයිඒ 2868620) රොනල්ඩ් පෝල් බර්තලොට් (වර්තමාන පදිංචිය - 146, වෙස්ට්කෝට්ස් ඩ්‍රයිව්, ලීසෙස්ටර්, LE30SP එක්සත් රාජධානිය) (ශ්‍රී ලංකාවේ 353/1, පාසල් මාවත, තලංගම රාජගිරිය හි පදිංචි සහ ජාතික හැඳුනුම්පත් අංක 571820137 X දරන) වන මම රෝමයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ දී වර්ෂ 2014 ජුනි මස 11 වැනි දින අත්සන් තබන ලද සාමාන්‍ය ඇටර්නි බලපත්‍රය මගින් මාගේ ඇටර්නි බලකරු ලෙස කෝට්ටේ, මාදිවෙල, ඔබේහේන පාර, නො. 44/2 හි පදිංචි එලිසබෙත් ජොස්ෆින් මෙන්ඩිස් (ජා. හැ. අ. 595761786 V) යන අය පත් කිරීම වර්ෂ 2020.03.16 වැනි දින සිට මෙයින් නීත්‍යානුකූලව අවලංගු කරන බව ශ්‍රී ලංකාවාසී සියලු දෙනාට මෙයින් දැනුම් දෙනු ලැබේ.

රොනල්ඩ් පෝල් බර්තලොට්.

06-21

## ඇටර්නි බලය අවලංගු කිරීම

ඉතාලිය, බොලෝන්යා, ටෙරස්, පයටියටි, සනෝ, කාසල්, 40024, නො. 18, මොටියෝලි, නො. වියා 9 හි පදිංචි (ඉතාලියානු ගුවන් ගමන් බලපත්‍ර අංක YA 2868620) රොනල්ඩ් පෝල් බර්තලොට් (වර්තමාන පදිංචිය - 146, වෙස්ට්කෝට්ස් ඩ්‍රයිව්, ලීසෙස්ටර්, LE30SP එක්සත් රාජධානිය) (ශ්‍රී ලංකාවේ 353/1, පාසල් මාවත, තලංගම රාජගිරිය හි පදිංචි සහ ජාතික හැඳුනුම්පත් අංක 571820137 X දරන) වන මම කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එච්. කේ. ජී. පර්සි ද සිල්වා වර්ෂ 2006 අගෝස්තු මස 03 වැනි දින ලියා සහතික කල අංක 3107 දරන ඇටර්නි බලපත්‍රය මගින් මාගේ ඇටර්නි බලකරු ලෙස කෝට්ටේ, මාදිවෙල, ඔබේහේන පාර, නො. 44/2, හි පදිංචි එලිසබෙත් ජොස්ෆින් මෙන්ඩිස් හෙවත් නී බර්තලොට් (ජා. හැ. අ. 595761786 V) යන අය පත් කිරීම වර්ෂ 2020.03.16 වැනි දින සිට මෙයින් නීත්‍යානුකූලව අවලංගු කරන බව ශ්‍රී ලංකාවාසී සියලු දෙනාට මෙයින් දැනුම් දෙනු ලැබේ.

රොනල්ඩ් පෝල් බර්තලොට්.

06-22

---

## ඇටර්නි බලපත්‍රය අහෝසි කිරීම

හෝමාගම, පිටිපන පාර, අංක 82 දරන ස්ථානයේ පදිංචි හඳා උක්වත්ත මායාදුන්න නොහොත් උක්වත්ත කන්කානම්ගේ හඳා මායාදුන්න (ජාතික හැඳුනුම්පත් අංක 645021665 V හිමි) වන මම, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආනන්ද කුලවංශ විසින් සහතික කරන ලද අංක 1075 සහ 2015 සැප්තැම්බර් මස 16 දින දරන බත්තරමුල්ල, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දිනපොත් අංක 162 යටතේ 3827 වෙළුමේ 41 වන පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇති ඇටර්නි බලපත්‍රය මගින් හෝමාගම, පිටිපන පාර, අංක 82 දරන ස්ථානයේ පදිංචි තිස්ස රංජිත් මායාදුන්න (ජාතික හැඳුනුම්පත් අංක 542484063 V) යන අයට දෙන ලද ඇටර්නි බලය වර්ෂ 2020 මැයි මස 22 වැනි දින අවලංගු කර නිශ්ප්‍රභා කර බලරහිත කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙනු ලැබේ. 2020 මැයි මස 22 වැනි දිනෙන් පසුව ඉහත කී ඇටර්නි බලය යටතේ එකී තිස්ස රංජිත් මායාදුන්න විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවක් සම්බන්ධයෙන් මම වග නොකියන බව ද දැනුම් දෙමි.

හඳා උක්වත්ත මායාදුන්න නොහොත්
උක්වත්ත කන්කානම්ගේ හඳා මායාදුන්න.

2020 මැයි මස 22 දින දී ය.

06-13

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | | |
|---|---|---|
| | *රු.* | *ශ.* |
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොළොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** | **තැපැල් ගාස්තුව** |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2020 වර්ෂය** | | | |
| **ජුනි** | 2020.06.04 | බ්‍රහස්පතින්දා | 2020.05.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.06.12 | සිකුරාදා | 2020.05.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.06.19 | සිකුරාදා | 2020.06.04 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2020.06.26 | සිකුරාදා | 2020.06.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ජූලි** | 2020.07.03 | සිකුරාදා | 2020.06.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.07.10 | සිකුරාදා | 2020.06.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.07.17 | සිකුරාදා | 2020.07.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.07.24 | සිකුරාදා | 2020.07.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.07.31 | සිකුරාදා | 2020.07.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අගෝස්තු** | 2020.08.07 | සිකුරාදා | 2020.07.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.08.14 | සිකුරාදා | 2020.07.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.08.21 | සිකුරාදා | 2020.08.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.08.28 | සිකුරාදා | 2020.08.14 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ - 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.